සියලුම හිමිකම් ඇවිරිණි
All Righis Reserved

# කැලණිය අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය 2016

## 9 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

නම/විෂය අංකය ------------------------------------------------------------------------ කාලය පැය 2

- I කොටසට හිමි ලකුණු සංඛ්‍යාව 40 කි
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1-3 තෙක් ඇති ප්‍රශ්න වලට දී ඇති අප්තෝපදේශයට ගැලපෙන වාක්‍ය තෝරන්න.

01. දුවන මුවන් දැක නොදමවී නෙළු පළා
    (1) අඩුව තිබෙද්දී අත පුළුස්සා ගන්න එපා
    (2) සැක සහිත දෙයක් නිසා නිසැක දෙය නොහල යුතුය
    (3) මුවන් පසුපස එළවීමෙන් වළකිනු
    (4) බත් නැතිවිට කොස් වුවද ආහාර සඳහා තෝරාගත යුතුය

02. පිරුණු කළේ දිය නොසැලේ
    (1) උගත් අය පුහු ආටෝපවත් බස් නොදොඩන බව
    (2) උගතුන්ගේ දැනුම කොතෙක් බෙදුවත් අඩු නොවේ
    (3) කළයක් දියෙන් පිරුණු විට එය සෙලවිය නොහැකි වේ.
    (4) දිය සෙලවෙන්නේ අඩුවෙන්ම දිය ඇති කළේය.

03. උඩින් ඔපේ - යටින් හපේ
    (1) පෙනුමට ඇති දෙය ඉතා වටිනා බව
    (2) පෙනුමේ තරමට ක්‍රියාව නැත
    (3) සම්මතයට අනුව කටයුතු කිරීම
    (4) තමන්ට නොගැළපෙන යම් ක්‍රියාවක් සිදුකිරිම

- නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න

04. (1) නිශ්චල, දුෂ්චරිත, අශ්වයා , ප්‍රසිද්ධ
    (2) ඊශ්වර, අෂ්ටාංග, නිශ්චල, දුරේක්ෂය
    (3) ලක්ෂණ, නිෂ්පාදන, ආස්වාද, ප්‍රස්තාර
    (4) අක්ෂි , විශිෂ්ට, උෂ්න, විෂ්වය

05. (1) වර්ධනය, වර්ෂය, උත්කර්ෂ, ආස්වාද
    (2) මර්ධනය, දුරේක්ෂය, අස්ථාන, විශ්වාස
    (3) දුෂ්චරිත, ශිෂ්ටාචාරය, කනිෂ්ඨ, තෘෂ්ණාව
    (4) තෘණ, ආෂ්වාස, පශ්චාත්, විශ්ව විද්‍යාලය

• ඉරි ඇඳි කොටසේ වඩාත් සමීප අර්ථය තෝරන්න.

06. සමහර ප්‍රදේශවල කැළෑවේ නීතිය තවමත් පවතින බවට ආරංචි වී ඇත.
(1) බලවතා දුබලයා පෙළීම (2) හොරෙන් ඇව කැපීම
(3) අනවසර පදිංචිය (4) වනසතුන් දඩයම

07. සමහර විචාරකයෝ නිර්මාණකරුවන් ගොනාට අන්දවති
(1) විහිළුවට භාජනය කරති (2) පැසසුමට කැමති වෙති
(3) දැඩි විවේචනයට ලක් කරති (4) මුලාකිරීමට යත්න දරති

08. බොරදියේ මාළු අල්ලන්නට සූදානම් වන්න එපා යැයි සාමාජිකයන් සභාපතිට කීවේය.
(1) අවුල් තත්වයෙන් අයුතු ඵල නෙලා ගැනීමට (2) දුෂ්කරතාවලින් ගොඩඒමට
(3) අහිංසකයින් පමණක් අල්ලා ගැනීමට (4) මුලාකිරීමට යත්න දැරීමට

• පළමු පදයට විරුද්ධාර්ථය නිවැරදිව යෙදී ඇති වරණය තෝරන්න.

09. (1) පරසිඳු - ප්‍රසිද්ධ (2) ජලය - උදක
(3) චංචල - නිශ්චල (4) ආධුනික - නවක

10. (1) සංකීර්ණ - අමාරු (2) ආවරණය - නිරාවරණය
(3) පොළොව - භූමිය (4) සාධනය - නිශේධනය

• පහත සඳහන් පද අතුරින් උපසර්ග පදයක් නොවන වරණය තෝරන්න.

11. (1) ප්‍රතිපක්ෂ (2) උදුල (3) සුදන (4) පුන්සඳ

12. (1) අවගුණ (2) අතිගැඹුරු (3) සිරිත් (4) පබල

• පහත සඳහන් වචන වල හිස්තැනට ගැළපෙන අක්ෂර අනුපිළිවෙලින් ඇතුළත් අක්ෂර පේළිය තෝරන්න.

13. ජ්‍යෙ-------ඨ, ප-----විම, සමර්-----, ප්‍රස්-------වනා
(1) ෂ, ශ,ඨ, ත (2) ශ, ෂ, ත, ඨ (3) ස, ෂ, ඨ, ත (4) ශ, ස, ත, ඨ

• පහත වාක්‍යාංශ වෙනුවට යෙදිය හැකි තනිපදය තෝරන්න.

14. රටින් රට ගමනේ යෙදීම
(1) දේශ ගවේෂණය (2) සංචාරක (3) විදේශික (4) ආගමනය

15. තමාගේ මතය අනුව ක්‍රියා කරන ,
(1) ආත්මාර්ථකාමී (2) අත්තනෝමතික (3) ස්වාර්ථය (4) මතිමතාන්තර

• පහත සඳහන් වාක්‍යවල ඉරිඇඳි පද අයත්වන ක්‍රියාපද වර්ගය තෝරන්න.

16. අවහොත් මෙහි උන් ලුහුබඳවා
(1) විධික්‍රියා (2) පූර්වක්‍රියා (3) මිශ්‍ර ක්‍රියා (4) අසම්භාව්‍ය ක්‍රියා

17. යළි උපදින්නට හේතු වාසනා වේවා
(1) අවසාන ක්‍රියා (2) මිශ්‍ර ක්‍රියා (3) ආශිර්වාද ක්‍රියා (4) විධි ක්‍රියා

- හිස්තැනට සුදුසු ආඛ්‍යාත පදය තෝරන්න.

18. මැණියෝ දරුවන්ට ඔවදන්

(1) දුන්නාය (2) දුන්හ (3) දෙයි (4) දුන්නිය

- නිපාත පදයක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.

19. (1) ඔහු යළි ගමට පැමිණෙයි (2) පුරා හදක් සේ ඇතින් එන්නේ

(3) සියලු සතුන් කෙරෙහි මෙත් සිත පතුරවන්න. (4) වී ගොවිතැන දැහැමි රැකියාවකි

- මුල් පදයේ අර්ථයට සමාන අර්ථයක් දෙවනි පදයෙන් නොදෙන වරණය තෝරන්න.

20. (1) යානවාහන (2) ගුණ අගුණ (3) සමිතිසමාගම් (4) මිලමුදල්

## II - කොටස

- 1,2, 3 අනිවාර්ය වේ
- 4, 5, 6 යන ප්‍රශ්න වලින් දෙකකට පිළිතුරු ලියන්න.

01. කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස පන්ති කාමරයේ ඔබ සකස් කළ බිත්ති පුවත්පත ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
   i. බිත්ති පුවත් පතට ඔබ යෙදූ නම කුමක්ද? (ල.02)
   ii. බිත්ති පුවත්පත සැකසීමට ඔබ තෝරාගත් තේමාව කුමක් ද? (ල.02)
   iii. බිත්ති පුවත්පතට ඇතුළත් කළ කරුණු පිළිබඳඉතා කෙටි හැඳින්වීමක් ලියන්න. (ල.04)
   iv. මේ සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීමට උපකාර කරගත්දේවල් 04 ක් දක්වන්න. (ල.04)
   v. මෙම ක්‍රියාකාරකම තුළදී එය සිදුකිරීමේ දී ඔබ මුහුණ පෑ ගැටලු 02 නම් කරන්න. (ල.02)
   vi. කණ්ඩායමක් ලෙස ක්‍රියාකිරීම මගින් මෙහිදී ලැබූ වාසි 02 ක් ලියන්න. (ල.02)

02. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන රචනයක් ලියන්න.
   i. කළණ මිතු ඇසුර
   ii. ජනකවියයි - ගැමි දිවියයි
   iii. සංස්කෘතික දායාද රැකගනිමු
   iv. මත් උවදුර හා ළමා පරපුර
   v. මා කියවූ හොඳම පොත

(ලකුණු 14)

03. ඔබ පාසලේ පවත්වනු ලැබූ වාර්ෂික ත්‍යාග ප්‍රධානෝත්සවය පිළිබඳව පුවත්පතකට යැවීමට සුදුසු පුවත්පත් වාර්තාවක් සකස් කරන්න. (ලකුණු 10)

04. පහත සඳහන් ප්‍රකාශ උපුටා ගත් පාඩම සහ එය කා විසින් කාහට කියන ලද්දක් ද යන්න සඳහන් කරන්න.
   i. මහ රජතුමනි මා දුක් වන්නේ මං ගැන නෙමෙයි
   ii. සමන් පුතේ මමගිහින් එන්නම්
   iii. ගමේ මිනිසුන්ට ඕව කරන්ඩ සල්ලි නෑ ඊටත් කවුරුත් ලැහැස්ති වෙයි නිකං ඉගෙන ගන්ඩ
   iv. මා කොහොමද සල්පිලේ බඩු තියාගෙන වෙළදාම් කරන්නේ
   v. ඒ යෝධයා මොකද මෙහේ?

(ලකුණු 10)

05. ඔබ පාසලේ වාර්ෂික කලා උළෙල සඳහා සුදුසු න්‍යාය පත්‍රය සකස් කරන්න. (ලකුණු 10)

06. පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

සුරරද සමන් සමගින් සුරගන එවර<br>
පැහැනද මදාරා පරසතු මල් පතර<br>
කැරපුද වඳින රැදි මුනි සිරිපා තඹර<br>
සකිසඳ පෙනේ සමනොළ ගල නැගෙන හිර

   i. මෙහි සඳහන් සමනළ අඩවියට අධිපති දෙවියන් නම් කරන්න.
   ii. මෙම කවියේ දිව්‍ය ලෝකයේ ඇති මල් වර්ග දෙක නම් කරන්න.
   iii. සමනළ අඩවිය බෞද්ධයන් හට වැදගත් වන්නේ කුමක් නිසාද?
   iv. මෙම කවියෙහි ඇතුළත් කාව්‍යලංකාරය නම් කරන්න
   v. පහත වචනවල අර්ථය ලියන්න.
      (i) සකි (ii) පැහැ

(ලකුණු 10)